පහන් වැට

ගිහිගත් බුද්ධය

බුද්ධයේ සාපයෙන්
ආසාණව
ඉකිගසන ලෙසත් පොව
මහ පොළොව වෙත අපා
සාප කරන්වදේ නුඹ
බුද්ධයේ ගිහිදරුව...
ඔය පුළුව් ලෙසත් පොව
මා වෙනට යොමු කරන්
මගෙ ලෙලුව වැලපෙන
නුඹ ගෙමින් වැලපුනා....
ලොකුම ලොකු කැළෙක්
මගේ ළය මත වැටී
හදාපනට කිසු බසස
පනුලටම පර වුණා

සංගෙපිකි....

නුඹ දමිල මම සිහැදු
කියා කතන කිසි අඳුවක්
අපට ලේ මස් සහර වලින්
මනුස්සකම පිරංණු දඳිත්
අප ලෙසදත් සමානයි....
ජීවනයම පුරවන්න
ආදරයෙන් හිනාවෙවි
හෙට දවසේ පොළොනගන්න
ඔය දෘෂ්ඨ මෙහෙට දියන්...

ශ්‍රීලක්ෂි ප්‍රියංවද

වත්තෝරයා
කන්දුරා

වසරක් ගතව ඇත

ගෙදර ගියත් ගෙයි මිදුලේ ඔබ පෙනෙන්න නෑ
සමන් පිච්ච ගහේ මලුත් දැන් හැසදන්නෙ නෑ
හැන්දෑවට බුදුන් වඳින හඬක් ඇත්තෙ නෑ
ඒත් අම්මෙ ඔබ මැරුණයි මට හිතෙන්නෙ නෑ

ප්‍රියන්තා තඹව්ට

ක්ලේරිගිබ්රින්

වෙනස

අහස්කුස ඉරාගෙන
වැටෙටන වැහි බිංදුවක
සුන්දරත්වය
දකින කවි සිතක්
පොල් අතු පියස්සෙන්
පතිත වී
ගොම පොළොව මඩ කරන
ඒ වැහි බිඳුවටම
කරන්නේ සාපයක්!

මේනකා ජයතිලක

ක්වින්ස්ලන්තය

සොනායා

දරාගන්නට බැරි තරම් පාළුයි මුළු හිවසම මට
මම හැඳුණේ පාළුවට වඩා වෙන්වුණු දුකට
නුඹ උපන් ද පටන් වෙන්වූ ණේ නෑ අපි කිසිවකට
අදයි නුඹ පළමුවෙන් ළදරු පාසල් ගිය දවස

නුඹෙ අප්පච්චි වීත් සැනසුවා මා හිස සිඹ
ඒත් පිළකාශන්ට බැරි තරම් මට මගේකඳුළු කැට
නුඹ ගෙදර එනතුරා ගෙවුණු කාලය කල්පයක්වද
දරුවෙකුට ඇති සෙනෙහෙ මහමෙර තරම් නොවෙද

හඬන්නට උපන් අපි සිනහා ගැන්වූයෙ නුඹයි
කටු පිරුණු මාවතේ නුඹ අපේ මල් මීටයි
කිසිවක්ම නොලද අපි ලද එකම සම්පතයි
නුඹව අපි ලැබුයේ දෙව්ලොවින්දැ'යි සැකයි

චාන්දනී කුලතුංග

නවසීලන්තය

කලකට පසු කතාරගම ආ ගමන

මැණික් ගඟ හිඳි ඇත
රට පුරා වැසි අතත්
සොරොව්වේ දිය බැඳි- පාර වැරදී
ගොසින්

කුංචනාදය කලේ
දරාවෝය කෙළිකවට
නඟවෝය අළියෝ - ගඟ අසල මඩ වලක

දාළි ඇඟිලි තැවරුනඳ
කිළිටි නොමවෙන තෙම
පැන් ඉසිනු කුමකටද - එකතු කළ පර
මලක

වස විසින් පැහැර ගැණුනු
පලතුරුන් පිදෙන කල
උදහසක් වෙනු ඇතැ'යි - බිය සිතින
දෙව්වරුන

කෝවිලෙන් පිටමංව
බැසි සිතින් එන මගෙහි
නොසන්සුන් දරුවෝය -
වට්ටියටට පොර බඳන

මුවන් සේ බියපත්ව පොර බැඳුව
මුත් මවුන් කක්කියට
හැළවෝය ඒ'පලවැල - වට්ටියට ලොබ
වෙමින

අතලොසක් සෙත් පතා
වඳින කල කිරිවෙහෙර
සිත් සතන් පුපුරුවා - ජන ගඟකි පොල්
ගසන

පාලමෙන් එනොඩ වී
දැක බලා කතරගම
හියැ සිතින් එන කලට
ගඟදිටට විසැදි ගඟ සුසුම්ලන -
හඬ ඇසින
අතරමංවූ ලෙසින.

චන්ද්‍රිකා ද සිල්වා

පර්ත්

අත්තම්මා සහ මරණය

සෙනසුරා ආව කල
ලෙඩ වුණා අත්තම්මා
ඇසිල්ලෙන් හොසිතු ලෙස
සිරවෙලා 'ලේ කැරේය'
කියන්නකො අත්තම්මේ
සිදුවුණේ කිම කියලු
අපේ සිත් හඬවලා
ඔබේ මුව ගොළුවෙලා.....

සැමදෙන කියූ ලෙසට
පසන් කරවීය ඔබ
කරදරයි හිඳපු හම්
ලෙඩ ඇඳක් මතට ඒ
නමුත් අත්තම්මේ අද
ඔබ ඇඳක් මත්තෙමයි
කෙළෙසකද වාවන්නෙ
හොඳැස්ස මට වැටහෙන්නෙ.....

'ලේ කැරේය' වෙත ලියමි,
-සිතක් පපුවක් නැතිදැ?
අයුක්තිය නොපෙනේදැ?
කරුණාවව වදහොතා මගේ අත්තම්මාට
සැමට ඔවදුන් දෙනා මගේ අත්තම්මාට
වේදනා දෙවන්නටද?
දියවෙන්නෙ නැතිද ඔබෑ
මගේ කඳුලැලි වලට....."

රෝහලේ සිටින වීට
ගියෙමි ඔබ බලන්නට
වෙනදට මා දකින
'බුදු සරණ' වෙනුවාව
සේලුයින් බෝතලුයි
සිරියය ඔබේ තනිවාව
අප ඇතුළු වූ විගස - නැගූ ඒ
කෙඳිරිල්ල
අද වගන්මයි මතක.....

පටන් එදවස මගේ
හදේ ඇසිවූ හිත්න
බුර බුරා පැල්වෙනවා
අත්තම්මේ දකින වීට
සිසිවෙකුට බෑ හිවහු
හදේ ඇසිවූ හිත්න
කල්පයක් ගොසින් වුව
අමතක නුසුවද.....

විරංගා ද අල්විස්

මාකොළ දකුණ
කැදණිය ශ්‍රී ලංකාව

පාළුයි අපට

වසර දහයකට පෙර
ඉල් මසෙහි එක් දිනෙක
මහ අතති මිණක් ලෙස
ළමැදටම තුරුළු කොට
හිවහතට රැගෙන ආ
අප බිඳිලු දියණියේ

එදා සිට මෙදා තෙක්
නෙත ගැටෙටන තැනකමයි
අත පොවන දුරකමයි
අප ඔබව තැබුයේ

පාසලෙන් පවත්වන
ගිම්හාන කැඳවුරට
පිටිතේ මුළුවටට
අපගෙ දියණිය ගොසින්

අයය හඬන හඬ නැතුව
ඇගෙ සිනහ හඬ නැතුව
දහකාරකම් නැතුව
දින තුනක් දිවා රෑ
කෙළෙස ගත කරන්නද?

නංගියා එය කළා
නංගියා මෙය කළා
සතියෙ දින හත පුරා
ගතු කියන සොහොයුරා
නංගියෙක් මට එපා
බිනු බස් ඉවත ලා
අයය නැවත එනතුරා
දින ගනී මග බලා

ගාමිණී ලක්ෂ්මන් ගමගේ

හැම්ප්ටන්පාර්ක්

මගේම සඳ ඔබ..

රිදී පැහැ සඳ වතුරේ
සිසිල් රැල් සෙනහවේ,
දයාවෙන් එළිය වුණ
තාරකා සිත මගේ....

නෙත් පුරා රස වින්ද
කිතිකැවුණු හඳවතට
නුරාවෙන් දකුරලා....
සෙනෙහසේ ගංගාවෑ;

ගොළු මුහුද ගොළු නොවේ
ඔබේ මුදු වදන් සඳ
සෙනෙහසට උණුසුමක් ඔබ
නිගාවේ තනිකමට

සෙනෙහසේ සදනන
ප්‍රේමයේ තාරකාවීය
වෙන් නොවේ දිවා කල මා
ඔබේ හදවතේ සඳ....

පුෂ්පිකා ගමගේ

රොක්ස්බර්ග්පාක්

කියන්න මට..

සඳ පායා මිරු ඔබේ
තරු පායා එන යාමේ...
ඔබේ ළඟින් සසර පෙත්තට
දොසක් ඒදිද කියන්න..

මිරු පායා සඳ ඔබේ
තරු සෑති බිඳෙදි යාමේ..
ඔබේ ළඟින් අඳදිනන
දොසක් ඒදිද කියන්න..

යසා හෙනෙබර්ල්

ජර්මණිය

ඉල්ලීම

හියැ වැස්ම සකසගෙන
බඳ පටිය තිසි පටිදි
ඔප දැමුව බූට් එක
පුණිසි නිල ඇඳුම
උස් තැනින් අවසරය
නොලැබේ'යි සිතන්නට
ම'සිත නැහැර යන් කලේ

නිදි වැරුව බංකරය
තියැ වසක් සැනවිලා
අයය වෙතට ආ පසෙයි
මල්සරා නිගැහුණා

නැගණියට මා එකම
සහකරුගෙ අත ගන්න
හෝරාව හෙට යෙදේ
පිය අඹුව සපුරන්න
යා යුතුයි යසෙස් හෝ

'අනේ මගෙ බුදු සර්...'
'කිව්වා යන්න එළියට !
ආරක්ෂාව ගැන රවේ
හැඟීමක් නැහැ මුණ්ට'

ධර්ම කොඩිප්පිලි

මැවෙන හීන

හිමිදිරි කිරණින් බබලන
පබළු පළිලිඳ දේදුන්නක
යහන සඳ හිඳ කුටියක
ඔබ සතපන්නම්....
සමනල තටු වාමරයෙන්
පවන් සැළන්නම්
පිපාසයට අමාවතුර
බොන්නට දෙන්නම්
කුසගින්නට දිව්‍ය බොජුන්
කන්නට දෙන්නම්
සිගින් සිතිඳු වළාකුළින්
ගත සරසන්නම්....

ධර්මවර්ධන රණසිංහ

අහිමි ප්‍රේමය

ඇඟි පියන් යට
සැනවී තිබූ ආදරය
නෙතේ කොණාට ගලා විත්
කඳුළු ලෙස දසස තුළ
අහෝ!
නුඹ කොහෙද කොතැනකද
දැවෙයි මා දසස
ඔබ රැවම දකින තුරු
ගමේ ඔය දසස මත
මගෙ ආදරය තබන තුරු
මට දැනෙන දුක් ගින්න
කෙලෙස මා කියන්නෙමිද
අහෝ!
දසස මත ඇති ප්‍රේමය ගලා විත්
දෙකොපුලින් බිමට වැටී
රළු පොළව මත
සිඳ බිඳ ගිය දිනක
මගේ හදවතට දැනෙන දුක
කෙසේ නම් නවතමිද
දරන්නට බැරිය එය
මියෙන්නට සිතත් මට
අහෝ!
මගෙ ළොවට ආමුණකි
දිව් මගට බැඳිමකි
ඔබ ළඟා ගනු පිණිස
බැරිය එය සිඳලන්න
දුර සිටන් බලමි ඔබ දෙස
පතන්නෙමි ඔබට මම
සැකයුදි දිනන්නට ජීවිතය
ලබන්නට ආදරය
මගෙන් තොර වූ ලොවක

ප්‍රසාදි ප්‍රියංකා

මෙල්බර්න්

ඔබ සිලිලාරයක්මැ'යි

සැළෙන සිලිලාරයක් ලෙසින් විත්
මතක අතුරා සිත පුරාවට
හීන නම් මට හුඟක් යා කර
යන්න ගිය දුර දන්න ළඟකට

දන්නෙ නම් ඔබ මතක අතුමුළු
ගිනිත් ඇඟිදින දකින වරකට
සනාතන පෙම දරා නෙතු ළඟ
අනේ ඉවසන තරම මං මම

පියා අසිපිය දුක වහං කර
නුඹට යන්නට මග කියා දී
පෙමෙ වැඩි මිතුදම රකින්නට
නුඹඹේ දුර ගියෙ මංම නොවෙමද?

තීනා

නැගෙනහිරන්

සන්නසයට පමණ බලන්න ගිම්හානකරවලි ගිම්හානකරවලි www.ketapathpawra.com වෙබ් අඩවියට හොඳටම අමතක නොකරන්න